අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/02/29/02/02/06(i)
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2021.11.09

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

**නව ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ ඇමතූ මගේ සමාංක හා 2021.10.22 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. අංක 1885/38 හා 2014.10.23 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ 15 වගන්තිය අනුව හා මගේ සමාංක හා 2018.04.09, 2018.05.24, 2020.05.18, 2020.12.09, 2021.05.19 හා 2021.10.22 දිනැති ලිපි මගින් දීර්ඝ කරන ලද අන්තර්කාලීන විධිවිධාන අනුව ගුරු සේවයේ උසස්වීම් ලබා දීමේදී පහත පරිදි කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වමි.

I. 2019.10.22 දින දක්වා උසස්වීම් දින යෙදෙන ශ්‍රී ලංකා ගුරු සේවයේ සියලුම ගුරුභවතුන්ට සේවා කාලය හා අනෙකුත් අවශ්‍යතාවයන් හැර, වෘත්තීය සමාලෝචනය හා කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් සේ සලකා ගුරු සේවයේ ශ්‍රේණි උසස්වීම් ලබා දීමට ක්‍රියා කළ යුතුය.

II. 2019.10.23 දින සිට 2022.10.22 දින දක්වා කාලසීමාව තුළ තම උසස්වීම් දින යෙදෙන ගුරුභවතුන්ට ඊළඟ උසස්වීමට පෙර පුහුණුව (මොඩියුල) සම්පූර්ණ කිරීමේ කොන්දේසියකට යටත්ව අදාල උසස්වීම් ලබා දිය යුතු වේ. එම කොන්දේසියට යටත්ව උසස්වීම් ලබන ගුරු භවතුන් තමා උසස්වීම් ලබන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම මෙන්ම එම උසස්වීම ලැබීමට පෙර සිටි ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම යන කාර්යක්ෂමතා කඩඉම් දෙකම ඊළඟ උසස්වීමට පෙර සම්පූර්ණ කළ යුතුය.

III. නමුත් 2022.10.22 දින දක්වා කාලසීමාව තුළ 1 ශ්‍රේණියට උසස්වීම් යෙදෙන ගුරුභවතුන්ට ඉන් ඉහළ ශ්‍රේණි උසස්වීමක් නොමැති බැවින්, එම ගුරුභවතුන් කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ.

IV. අන්තර්කාලීන විධිවිධාන අවසන් වන 2022.10.22 දිනෙන් පසු උසස්වීම් දින යෙදෙන සියලුම ගුරුභවතුන් ගුරු සේවයේ උසස්වීම් සඳහා සේවා ව්‍යවස්ථාවේ සඳහන් ඊට අදාළ සියලු අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ යුතුය.

පී. කේ. එස්. සුභෝදිනී
අතිරේක ලේකම් (ආයතන)
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

පිටපත් :
(1) ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
(2) ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව - කරු. දැ.ගැ.ස.
(3) ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
(4) ආයතන අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
(5) ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන), අධ්‍යාපන අමාත්‍යාංශය - කරු. අ.ක.ස.
(6) අධ්‍යාපන අධ්‍යක්ෂ (ගුරු අධ්‍යාපන පරිපාලන), අධ්‍යාපන අමාත්‍යාංශය - කරු. අ.ක.ස.